# 2 ශ්‍රේණිය සිංහල

## පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු 03

## නිධානය

පාලිත පොඩිවිතාරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



Face Book 3in1 Youtube 3 in 1 Online
Class Details WhatsApp 071-9020298

# 3. නිධානය

එකෝමත් එක කාලෙක දක්ෂ ගොවියෙක් හිටියා.

මේ ගොවියාට පුත්තු හතර දෙනෙක් හිටියා.

මේ හතර දෙනා හරි ම කම්මැළියි.

පියා හම්බ කරන දේ කාලා ජීවත් වුණා.

පියාට උදවු කළෙත් නැහැ.

ඒ නිසා ගොවිතැන් වැඩත් බැහැ.

කිසි ම දෙයක්

ඉගෙන ගත්තෙත් නැහැ.



කාලයක් ගත වුණා.

පියා ලෙඩ වුණා.

පුත්තු හතර දෙනාට

ජීවත් වෙන්න බැරිව ගියා.

ගොවියා පුතුන් හතර දෙනාට

කතා කළා.

" කුඹුරේ නිධානයක් තියෙනවා,

කුඹුර කොටන්න. නිධානය ගන්න පුළුවන්." පියා කිවුවා.



පුත්තු හතර දෙනා නිධානය ගන්න කුඹුර කෙටුවා.

ඒත් නිධානය ලැබුණේ නැහැ.

“ නිධානයක් නැහැ.” පුත්තු පියාට කිවුවා.

“ කුඹුරේ වී වපුරන්න, එවිට නිධානය ලැබේවි.”

පියා ඔවුන්ට කිවුවා.

හතර දෙනා ම එකතු වෙලා වී වැපුරුවා.




වී පැළ වුණා. ගොයම් පැහුණා. වී ලැබුණා.

මහන්සි වී වැඩ කළ නිසා,

පුත්තු හතර දෙනා ධනවත් වුණා.

පියාගේ නිධානයේ රහස, ඔවුන්ට තේරුම් ගියා.

ඔවුන් සතුටින් ජීවත් වුණා.



# 3. නිධානය

**පාඩම කියවා පිළිතුරු ලියන්න.**

1. ගොවියාගේ පුත්තු ගණන කීය ද?

2. නිධානය තිබෙනවා කීවේ කොහේ ද?

3. පුත්තු ධනවත් වුණේ කොහොම ද?

**පහත වචන ශබ්ද නගා කියවන්න.**

| | |
|---|---|
| නිධානය | ධනවත් |
| ධජය | ආධාර |
| ධීවරයා | ආබාධ |
| අධික | ධර්මය |

සිදුවීම් ගළපන්න. අනුපිළිවෙළින් නැවත ලියන්න.

- » වී පැළ වුණා.
- » වී වැපුරුවා.
- » ගොයම් පැහුණා.

- » මිදුලේ වතුර පිරුණා.
- » අහස කළු වුණා.
- » වැහි බිංදු වැටුණා.

වචන ගළපා වැකි හදන්න.

1. ලෙඩ/පියා/වුණා

2. තියෙනවා/නිධානයක්/කුඹුරේ

3. නැහැ/ නිධානය/ඒත්/ ලැබුණේ

4. ධනවත්/පුත්තු/හතර දෙනා/ වුණා.



සමාන තේරුම ඇති වචන රවුම තුළින් තෝරන්න. හිස්තැන් පුරවන්න.

වෙල
මහන්සිය
රෝග
කම්මැළි
තාත්තා

1. පියා = ____________________

2. වෙහෙස = ____________________

3. කුඹුර = ____________________

4. අලස = ____________________

5. ලෙඩ = ____________________

# පිළිතුරු

## Answer



# 3. නිධානය

පාඩම කියවා පිළිතුරු ලියන්න.

1. ගොවියාගේ පුත්තු ගණන කීය ද?

හතරයි.

2. නිධානය තිබෙනවා කීවේ කොහේ ද?

කුඹුරේ.

3. පුත්තු ධනවත් වුණේ කොහොම ද?

මහන්සි වී වැඩ කරලා.

පහත වචන ශබ්ද නගා කියවන්න.

| | |
|---|---|
| නිධානය | ධනවත් |
| ධජය | ආධාර |
| ධීවරයා | ආබාධ |
| අධික | ධර්මය |

සිදුවීම් ගළපන්න. අනුපිළිවෙළින් නැවත ලියන්න.

- » වී පැළ වුණා.
- » වී වැපුරුවා.
- » ගොයම් පැහුණා.

වී වැපුරුවා.

වී පැළ වුණා.

ගොයම් පැහුණා.

- » මිදුලේ වතුර පිරුණා.
- » අහස කළු වුණා.
- » වැහි බිංදු වැටුණා.

අහස කළු වුණා.

වැහි බිංදු වැටුණා.

මිදුලේ වතුර පිරුණා.

වචන ගළපා වැකි හදන්න.

1. ලෙඩ/පියා/වුණා

පියා ලෙඩ වුණා

2. තියෙනවා/නිධානයක්/කුඹුරේ

කුඹුරේ නිධානයක් තියෙනවා

3. නැහැ/ නිධානය/ඒත්/ ලැබුණේ

ඒත් නිධානය ලැබුණේ නැහැ

4. ධනවත්/පුත්තු/හතර දෙනා/ වුණා.

පුත්තු හතර දෙනා ධනවත්

වුණා.



සමාන තේරුම ඇති වචන රවුම තුළින් තෝරන්න. හිස්තැන් පුරවන්න.

වෙල
මහන්සිය
රෝග
කම්මැළි
තාත්තා

1. පියා = තාත්තා
2. වෙහෙස = මහන්සිය
3. කුඹුර = වෙල
4. අලස = කම්මැළි
5. ලෙඩ = රෝග

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තුතියි !**

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

**Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1**

**එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ**